**අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2016

ආදර්ශ ප්‍රශ්න පත්‍රය

බුද්ධ ධර්මය පැය දෙකයි

බුද්ධ ධර්මය - II

- පළමු වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුලු ව **ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න.
- පළමු වැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

(1)

I. **"නිබ්බානං පරමං සුඛං"** යන්නහි අර්ථය ලියන්න.

II. ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක ලියන්න.

III. වාචසික කුසල කර්ම **දෙකක්** නම් කරන්න.

IV. ලංකාවට බුදු දහම හඳුන්වාදීමට පෙර පැවැති ආගමික විශ්වාස **දෙකක්** නම් කරන්න.

V. බුදු දහම අනුව **කර්මය** යනු කුමක් දැ යි නිර්වචනය කරන්න.

VI බෝසතාණන් වහන්සේ **දාන පාරමිතාව** සම්පූර්ණ කළ ආකාරය කියැවෙන ජාතක කතා 02ක් නම් කරන්න.

VII. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ඇතුළත් පුද්ගලයාගේ **මෙලොව හිත සුව පිණිස** හේතුවන කරුණු අතරින් **දෙකක්** නම් කරන්න.

VIII. **සාහස්සිකා සංගීතිය** යනු කීවෙනි ධර්ම සංගායනාව ද? එයට **අනුග්‍රහය** දැක්වූයේ කවුද?

IX. බුදු රජාණන් වහන්සේ වෙනුවට වන්දනා කිරීම සඳහා මුල් කාලයේ දඹදිව ශිල්පීන් භාවිත කළ **සංකේත දෙකක්** සඳහන් කරන්න.

X. පද්ම උපමාවට අනුව සමාජයේ දක්නට ලැබෙන පුද්ගල **පෞරුෂ දෙකක්** නම් කරන්න.

(2)

I. දස රාජ ධර්මවලින් **හතරක්** නම් කරන්න.

II. ඉන් **එකක්** පිළිබඳව කෙටියෙන් දක්වන්න.

III. සාර්ථක දැහැමි රාජ්‍ය පාලනයක් බිහි කිරීමට දස රාජ ධර්ම උපයෝගී කර ගන්නා ආකාරය ඔබ කැමති රාජ ධර්ම **පහක්** ඇසුරින් පැහැදිලි කරන්න.

(3)

I. **"සුපටිපන්න"** යන්නෙහි අදහස ලියන්න.

II. සංඝ රත්නයෙන් සිදුවන **ආගමික, සාමාජීක හා ජාතික** සේවාවන්ට නිදසුන බැගින් පෙන්වා දෙන්න.

III. **"යහපත් සමාජයක් බිහි කිරීමේ නායකත්වය පැවරී තිබෙන්නේ මහා සංඝ රත්නයට ය"** මෙම කියමන උදාහරණ **තුනක්** වත් ඇසුරින් පැහැදිලි කරන්න.

(4)

I.සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳ දේශනා ඇතුළත් සූත්‍ර ධර්මය නම් කරන්න.

II. "යමක් නොපිළිගත යුත්තේ කවර කරුණු පදනම් කරගෙනද? " යනුවෙන් බුදුරජාණන් වහන්සේ **කේසපුත්ත වැසියන්ට** දේශනා කළ කරුණු අතුරින් **තුනක්** ලියන්න.

III. "සිතා විමසා කටයුතු කිරීමෙන් ශිෂයෙකුට යහපත් අනාගතයක් ගොඩ නගා ගත හැකිය " විමසන්න.

(5)

I. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් ආකාරයට සේව්‍ය සේවක පිරිසට වෙන් කර ඇති දිශාව කුමක්ද?

II. **සේව්‍යයාගෙන් සේවකයාට** ඉටුවිය යුතු යුතුකම් **තුනක්** ලියන්න.

III. වර්තමාන සමාජයේ විවිධ ආයතනයන්හි පවතින ස්වාමි සේවක ගැටළු විසඳා ගැනීම සඳහා **සිඟාලෝවාද සූත්‍රයේ** ඉගැන්වීම් ගළපා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(6)

I. **"අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති"** යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

II. එහි අර්ථය ලියන්න.

III. "එකිනෙකාගේ ආධ්‍යාත්මික හා බාහිර සංවර්ධනය තමා ම සිදු කර ගැනීම තුළින් මුළු මහත් සමාජයටම යහපතක් වේ" ඉහත ගාථාවේ අර්ථය ඇසුරින් මෙම කියමන සනාථ කරන්න.

(7) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

I. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ නා හිමි.

II. ධම්ම පදය.

III. ශ්‍රී ලංකාවේ චෛත්‍යය.

IV. පටිච්ච සමුප්පාදය

**අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2016**

**ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**බුද්ධ ධර්මය I,II** **පැය තුනයි**

## බුද්ධ ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි **අංකයට සැසඳෙන** කවය තුළ (X) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙකුත් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා , ඒවා ද පිළිපදින්න.

(1) බුදු රජාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය ධර්මය අන්තර්ගත කොට පස්වග භික්ෂූන් වහන්සේලා අමතා දේශනා කළේ,
1. දම්සක් පැවතුම් සූත්‍රය යි. 2. අනන්ත ලක්ඛණ සූත්‍රය යි.
3. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි. 4. පරාභව සූත්‍රය යි.

(2) ගැබිනි මාතාවන්ගේ දරු ප්‍රසූතිය පහසු කිරීම උදෙසා දේශනා කරන පිරිත වන්නේ,
1. ජය පිරිත යි. 2. වැසි පිරිත යි.
3. අංගුලිමාල පිරිත යි. 4. ධජග්ග පිරිත යි.

(3) සාර්ථක ජීවිතයකට මං පෙත් හෙළි කර දෙන **බෞද්ධයාගේ අත්පොත** ලෙස සැලකෙන්නේ,
1. සිරිත් මල් දම යි. 2. ධම්ම පදය යි.
3. පිරුවානා පොත් වහන්සේ යි. 4. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ යි

(4) බෞද්ධ සහජීවන ප්‍රතිපදාව වර්ධනය කර ගැනීමට උපකාරීවන **සතර සංග්‍රහ වස්තුව,**
1. දානය , ප්‍රියවචනය, අර්ථචර්යාව හා සමානාත්මතාවයි.
2. මෙත්තා, කරුණා, මුදිතා හා උපෙක්ඛාවයි.
3. ඡන්ද, දෝස, භය හා මෝහයයි.
4. ඡන්ද, චිත්ත, විරිය හා වීමංසාවයි.

(5) අනුන්ගේ දුක දැක තම හදවතේ අනුකම්පා සිතිවිලි ඇති කර ගැනීම,
1.මෙත්තා ගුණයයි. 2. කරුණා ගුණයයි.
3. මුදිතා ගුණයයි. 4. උපේක්ඛා ගුණයයි.

(6) **සිවුසස් දහම** ලෙස හැඳින්වෙන්නේ,
1. සතර සංග්‍රහ වස්තුවයි. 2. චතුරාර්ය සත්‍යයයි.
3.සිව්බඹ විහරණයි. 4. සතර ඍද්ධිපාදයි.

(7) “මහමග සළකුණු වී තිබූ පියසටහන් දැක, එසේ ගමන් කොට ඇත්තේ කවුරුන්” දැ යි විමසමින් එම පිය සටහන් අනුව පියවර තැබූ තැනැත්තා සොයමින් ගමන් කළේ,
1.සර්වමිත්‍ර බමුණා ය. 2. ද්‍රෝණ බමුණා ය.
3.සෝණදණ්ඩ බමුණා ය. 4. උදය බමුණා ය.

(8) වෘක්ෂලතා නොමැති ව අපට ජීවත් වීමට නොහැකි ය. අපට ආහාර ඇතුලු බොහෝ සම්පත් ලබා දෙන්නේ වෘක්ෂලතා ය. වෘක්ෂ ලතා රැකීමට අප කළ යුත්තේ,
1. මල් පලතුරු උයන් වැවීමයි. 2. ඒ දඬු ඉදිකිරීමයි.
3. පාලම් ඉදිකිරීමයි. 4. පැන්හල් තැනීමයි.

(9) "නිරෝගීකම උතුම්ම ලාභයයි" මෙම අදහස දෙන පාලි පාඨය වන්නේ,

1. "සුභානු පස්සිං විහරංතං" යන්නයි. 2. "අරෝගා පරමා ලාභා" යන්නයි.

2. "යෝචේ වස්ස සතං ජීවේ" යන්නයි. 4. "උට්ඨානවතෝ සතිමතෝ " යන්නයි.

(10) භික්ෂූන් වහන්සේ සමාජයට බරක් නො වන ආකාරයෙන් සැදැහැවතුන්ගේ ප්‍රත්‍ය පහසුකම් ලබා ගත යුතු ය. බුදුරජාණන් වහන්සේ ඊට දැක්වූ උපමාව වනුයේ,

1. ගොනු පසුපස යන කරත්ත රෝදයයි. 2. හොද්දෙහි රස නො දන්නා හැන්දයි.

3. මගධ රාජ්‍යයේ වෙල්යායයි. 4. මල නොතලා රොන් ගන්නා බඹරායි.

(11) කමටහන් නො ලබා භාවනා කොට නොමග ගොස් බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ලබා සත්‍ය අවබෝධ කර ගත්තේ,

1.ස්වර්ණකාර තෙරුණ් වහන්සේ ය. 2. පුණ්ණ තෙරුණ් වහන්සේ ය.

3. ලකුණ්ඨක භද්දිය තෙරුණ් වහන්සේ ය. 4. උපවාන තෙරුණ් වහන්සේ ය.

(12) සාමඤ්ඤඵල සූත්‍රයෙහි සඳහන් පරිදි සසර බැඳ තබන බැමි හඳුන්වනු ලබන්නේ,

1. පංච අභිඤ්ඤා ලෙස ය. 2. පංච නියාම ධර්ම ලෙස ය.

3. පංච නීවරණ ධර්ම ලෙස ය. 4. පංචානන්තරීය පාප කර්ම ලෙස ය.

(13) දීර්ඝ කාලයක් තිස්සේ විජාතිකයන්ට යටත් වී සිටීම නිසා යටපත් වී ගිය ජාතික, ආගමික, අභිමානය ගොඩ නැගුවේ අනගාරික ධර්මපාල තුමා ය. එතුමා සිදුකළ මෙහෙයක් නොවන්නේ,

1. බරණැස මූලගන්ධ කුටි විහාරය ඉදිකිරීමයි. 2. සරසවි සඳරැස පුවත්පත ආරම්භ කිරීමයි.

3.පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීමයි. 4. මහනුවර නියම කන්දේ පිරිවෙන ආරම්භ කිරීමයි.

(14) සැබෑ ආගමික සහජීවනය යන්නෙන් අදහස් වන්නේ,

1.අන්‍ය ආගමික උත්සව තමන් විසින් පවත්වනු ලැබීමයි.
2.අන්‍යාගමිකයින්ට තම ආගමික කටයුතු නිදහසේ කරගැනීමට ඉඩ සැලසීමයි.
3.සමගිය වෙනුවෙන් සෑම ආගමක්ම එක සමාන බව සිතා කටයුතු කිරීමයි.
4.තම ආගමික කටයුතු වලට අන්‍යාගමිකයන් ද සහභාගී කරවා ගැනීමයි.

(15) වෙළඳාම තම දැහැමි ජීවන වෘත්තියක් ලෙස කරන ගිහියා වසවිස, මත්පැන්, ආයුධ, සත්ව වැනි අදැහැමි වෙළඳාම් වලින් තොරව කටයුතු කරයි. මෙම ක්‍රියාව හඳුන්වන්නේ,

1. සම්මා කම්මන්ත ලෙසයි. 2. සම්මා ආජීව ලෙසයි.

3.සම්මා වායාම ලෙසයි. 4. සම්මා දිට්ඨි ලෙසයි.

(16) තමා විසින් ම පිළිපැද ඇස් පනා පිට මෙලොවදී ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්ම රත්නය,

1. අකාලික වේ. 2. සන්දිට්ඨික වේ.

3. ඒහිපස්සික වේ. 4. ඕපනයික වේ.

(17) සීලයෙන් යුතුව සමාධි භාවනාව සඳහා යොමුවීමේදී "සති සම්පජඤ්ඤය" අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු ය. එහි "සති සම්පජඤ්ඤය" නම්,

1.හිඳීම, සිටීම, ඇවිදීම ආදී සියළු ක්‍රියාවන්හිදී සිහියෙන් යුක්ත වීමයි.

2.ඇස, කණ, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රියන් සංවර වීමයි.

3.ලද දෙයින් සතුටට පත්ව කටයුතු කිරීමයි.

4.අඩු ආශා ඇතිව කටයුතු කිරීමයි.

(18) "සමගියම යහපති" යන අදහස ඇතුළත් උතුම් බුදුවදන වන්නේ,

1."සමවායෝ ඒව සාධු" යන්නයි. 2."සමග්ගා හෝථ මා විවදථ" යන්නයි.

3."චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" යන්නයි. 4."ආරෝග්‍යා පරමා ලාභා" යන්නයි.

(19) හේතු ඵල දහමට අනුව තණ්හාව නිසා "උපාදානය" හෙවත් සිතින් දැඩිව අල්ලා ගැනීම සිදුවන අතර "උපාදානය" නිසා ,

1. "සළායතන" ඇති වේ. 2. "ඵස්ස වේදනා" ඇති වේ.

3. "භවය" ඇති වේ. 4. "ජරා- මරණ" ඇති වේ.

(20) මිනිසා මෙන් ම සතා සිවුපාවෝ ද පරිසර ජීවීහු වෙති. එබැවින් අපි පරිසරය රැකිය යුතු වෙමු. එහිදී **ජල දූෂණය වැළැක්වීමට** බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා හට මඟ පෙන්වූයේ,

1.පෙරහන් කඩක් භාවිත කරන ලෙස දේශනා කිරීමෙනි. 2.පරිසරයට කැළි කසල මුදා නොහරින ලෙස දේශනා කිරීමෙනි.

3.ජලය අරපිරිමැස්මෙන් භාවිත කරන ලෙස දේශනා කිරීමෙනි. 4.ජලයට අපවිත්‍ර දෑ දැමීම නොකළ යුතු බව දේශනා කිරීමෙනි.

(21) මෑත යුගයේ දී ථේරවාදී බුදු දහම ලොව පුරා ප්‍රචලිත කිරීමට පුළුල් අවස්ථාවක් සැලසුනේ,

1.එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම පිහිටුවීම නිසා ය. 2.පාලි බසින් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම නිසා ය.

3.අශෝක රජු නව රට සසුන් පිහිටුවීමට ක්‍රියාකළ නිසා ය. 4.කණිෂ්ක රජු මධ්‍යම ආසියාවෙහි ධර්ම ප්‍රචාරය කරවූ නිසා ය.

(22).ත්‍රිවිද්‍යාවට අයත් **අනුන්ගේ සිත් පිළිබඳ දැන ගැනීමේ** විශේෂ ඥාණය හඳුන්වන්නේ,

1.ආසවක්ඛය ඥාණය ලෙසයි. 2.පරචිත්ත විජානන ඥාණය ලෙසයි.

3.දිබ්බචක්ඛු ඥාණය ලෙසයි. 4.පුබ්බේ නිවාසානුස්සති ඥාණය ලෙසයි.

(23).ශික්ෂා පද සංඛ්‍යාව අනුව විවිධ ප්‍රභේද දක්නට ඇති සීලයෙහි, මුසාවාද, පිසුනාවාච, පරුසාවාච, සම්පප්‍රලාප යන ශික්ෂා පද ඇතුළත් වන්නේ,

1.පංච සීලය තුළ ය. 2.ආජීව අෂ්ටමක සීලය තුළ ය.

3.අෂ්ටාංග උපෝසථ සීලය තුළ ය. 4.දස සීලය තුළ ය.

(24). පුද්ගලයන්ගේ මෙලොව හිත සුව පිණිසත් පරලොව හිත සුව පිණිසත් **දීඝජානු කෝලිය සිටු පුත්‍රයා හට** බුදු රජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර ධර්මය වන්නේ,

1.සිගාලෝවාද සූත්‍රය යි. 2.ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.

3.කාලාම සූත්‍රය යි. 4.පරාභව සූත්‍රය යි.

(25). පුද්ගලයෙකු තම ආදායම ඉක්මවා **වියදම් නො කොට** කටයුතු කිරීම, බුදු දහමෙහි හඳුන්වා ඇත්තේ,

1."උට්ඨාන සම්පදා" ලෙසිනි. 2."ආරක්ඛ සම්පදා" ලෙසිනි.

3."කල්‍යාණ මිත්තතා" ලෙසිනි. 4."සමජීවිකතා" ලෙසිනි.

(26). පුද්ගලයෙකු තුළ විමසුම්ශීලී බුද්ධිය, අධිෂ්ඨානය, ඉවසීම, ආත්ම සංයමය, නොපසුබස්නා උත්සාහය හා උපායශීලීබව තිබේ නම් ඔහු තුළ

1.ථිනමිද්ධ වැඩේ. 2.ඡන්දය වැඩේ.

3.අභිධ්‍යාව වැඩේ. 4.යසස වැඩේ.

(27). උතුම් බුදු දහම ලංකාව පුරා ව්‍යාප්ත කරවීම සඳහා මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ධර්ම දූතයින් වහන්සේලා අනුගමනය කළ **දූරදර්ශී පිළිවෙත වූයේ,**

1.ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති සංස්කෘතිය විවේචනය කිරීම යි.

2.එතෙක් පැවැති ආගමික සංස්කෘතියට අවනත වීම යි.

3.ප්‍රාග් බෞද්ධ සංස්කෘතිය හඳුනාගෙන එහි හරවත් පරිවර්තනයක් ඇති කිරීම යි.

4.පෙර පැවති ආගමික චින්තන සමඟ බෞද්ධ සංස්කෘතිය මිශ්‍රකර ගැනීම යි.

(28). "**අවෙච්චප්පසාදය**" ලෙස හැඳින්වෙන්නේ,

1.ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු නොදැන ඇතිකර ගන්නා පැහැදීමයි.

2.ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇතිකර ගන්නා පැහැදීමයි.

3.ධර්ම රත්නය පිළිබඳ කරුණු දැන ඇතිකර ගන්නා භක්තියයි.

4.ධර්ම රත්නය හා සංඝරත්නය පිළිබඳ කරුණු දැන ඇතිකර ගන්නා විශ්වාසයයි.

(29). **කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම** පිළිබඳ සඳහන් වන බෞද්ධ රාජ්‍ය පාලන ඉගැන්වීම වන්නේ,

1.දස පින් කිරියවත් ය. 2.පංච සීල ප්‍රතිපදාව ය.

3.සප්ත අපරිහානිය ධර්මය යි. 4.සතර සංග්‍රහ වස්තුව යි.

(30). අප දෛනික ව මුහුණදෙන ගැටළු විසඳා ගැනීමෙහි වඩාත් **ප්‍රායෝගික ව යොදා ගත හැකි** බෞද්ධ ඉගැන්වීම වනුයේ,

1.හේතුඵල දහම යි. 2.පුනර්භව දහම යි.

3.අටලෝ දහම යි. 4.ත්‍රි ලක්ෂණ දහම යි.

(31). නිවැරදි රැකියාවක් කිරීම මංගල කරුණකි. මේ පිළිබඳ **මහා මංගල සූත්‍රයේ** සඳහන් වන පාලි පාඨය වන්නේ,

1.පූජා ච පූජනීයානං 2.පුට්ඨස්ස ලෝක ධම්මේහි

3.අසේවනා ච බාලානං 4.අනවජ්ජානි කම්මානි

(32). සීගිරිය හා හිඳගල සිතුවම් සුවිශේෂී වන කරුණක් වන්නේ,

1.පොළොන්නරු යුගයේ චිත්‍ර වලට වඩා වෙනස් චිත්‍ර සම්ප්‍රදායක් වීම නිසා ය.

2.බෞද්ධ තේමා මුල්කරගත් චිත්‍ර සම්ප්‍රදායක් වීම නිසා ය.

3.අනුරාධපුර යුගයේ මුල්කාලීන චිත්‍ර ලෙස සැලකෙන නිසා ය.

4.චිත්‍ර වර්ණ ගැන්වීමේ සුවිශේෂීතාව නිසා ය.

(33). සසර දුකින් නිදහස් ව නිවන් දක්නා ජාති දක්වා **යම්කිසි භවයකදී** විපාක දීමට ඉදිරිපත් වන්නේ,

1.දිට්ඨධම්ම වේදනීය කර්මයයි. 2.උපපජ්ජවේදනීය කර්මයයි.

3.අපරාපරිය වේදනීය කර්මයයි. 4.අහෝසි කර්මයයි.

(34)." දම්පියා අටුවා ගැටපදය" විශේෂ කෘතියකි. ඊට හේතුව,

1.බුදු ගුණ පද්‍යයෙන් රචනා කළ බැවිනි. 2.බුද්ධ දේශනාවලට විවරණ හා ගැටපද රචනා කළ බැවිනි.

3.පුරිස දම්ම සාරථී ගුණය තේමා කරගත් බැවිනි. 4.පුහුදුන් ජනතාවට උපදෙස් දෙන කෘතියක් බැවිනි.

(35). භික්ෂූන් වහන්සේලාගේ **කායික නිරෝගීතාව** සලකා බුදුරජාණන් වහන්සේ "සක්මන් මළුව" අනුමත කළ සේක. ඒ සඳහා ඉල්ලීමක් කළේ,

1.ජීවක වෛද්‍යවරයා ය. 2.අනේපිඬු සිටුතුමා ය.

3.කොසොල් රජු ය. 4.මිගාර සිටුතුමා ය.

(36). චුල්ලකම්ම විභංග සූත්‍ර දේශනාවේ දැක්වෙන කර්ම විපාක වල විවිධත්වයට අනුව **දීර්ඝායුෂ විඳින්නේ**,

1.ප්‍රාණඝාත කරන්නා ය. 2.ප්‍රාණඝාත නොකරන්නා ය.

3.සත්ත්ව හිංසාව කරන්නා ය. 4.සත්ත්ව හිංසාව නොකරන්නා ය.

(37). මහනුවර යුගයේ චිත්‍ර කලාව නූතන චිත්‍ර කලාව හා සසඳන කල එහි සුවිශේෂී ලක්ෂණයක් ලෙස පෙනී යන්නේ,

1.විවිධ වර්ණ රාශියක් භාවිතා කිරීමයි. 2.ජාතක කතා බහුලව භාවිත කිරීමයි.

3.බෝසත් චරිතය තේමා කර නොගැනීමයි. 4.මිනිස් හා සත්ත්ව රූප, ගස් වැල් ආදිය ස්වාභාවික ව නොදැක්වීමයි.

(38). වෙනත් කර්මයකින් **වළකාලිය නොහැකි** වඩාත් ශක්තිමත් බලසම්පන්න කුසලාකුසල කර්මය වනුයේ,

1.ගරුක කර්මයයි. 2.ආසන්න කර්මයයි.

3.ආචිණ්ණ කර්මයයි. 4.කටත්තා කර්මයයි.

(39). සිරිදාස දැතේ මහන්සියෙන් කෘෂිකාර්මික කටයුතුවල නියැලී **ධාර්මිකව** ධනය ඉපැයූ පුද්ගලයෙකි. මෙයින් ඔහු විඳින සතුට හැඳින්විය හැක්කේ,

1.අත්ථි සුඛ ලෙස යි. 2.භෝග සුඛ ලෙස යි.

3.අණන සුඛ ලෙස යි. 4.අනවජ්ජ සුඛ ලෙස යි.

(40). බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් වන **දස සක්විති වත්** ඇතුළත් වන සූත්‍රය වන්නේ,

1.කාලාම සූත්‍රය යි. 2.චක්කවත්ති සීහ නාද සූත්‍රය යි.

3.සිඟාලෝවාද සූත්‍රය යි. 4.ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.